GMOA
ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

**පුවත්පත් නිවේදනය** 01.08.2011

පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයන් යන නාමයෙන් මාලබේ ක්‍රියාත්මක වන ව්‍යාජ ආයතනයට නීත්‍යානුකූල භාවය ලබාදීමට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කරමින් යන බව පෙනියයි. මේ සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ සිටින යම් යම් පුද්ගලයන් උදවුකරන බවද දැන ගන්නට ලැබී ඇත.

මහාචාර්යය මල්කාන්ති චන්ද්‍රසේකර මහත්මිය පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කාය ව්‍යවච්ඡේද විද්‍යා අංශයේ සේවය කරනු ලබන්නිය. ඇය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකාවක් වන අතර වෛද්‍ය විද්‍යා හා දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ ස්ථාවර කමිටුවේ (Standing Committee) සාමාජිකාවක්ද වන්නිය.

ඉහත සඳහන් කළ මහාචාර්යවරිය මාලබේ පවත්වාගෙන යන ආයතනයේ "උපකුලපතිවරිය" වීම මෙම ව්‍යාජ ආයතනයට නීත්‍යානුකූල භාවය ලබාදීමට කිනම් පිටුවහලක් වුවාද යන්න, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සාමාජිකයන් විසින් අගෝස්තු 28 වන දින පැවති මධ්‍යම කාරක සභාවේදී ප්‍රශ්න කරන ලදී.

නිසි සුදුසුකම් හා පහසුකම් නොමැති ඉහත සඳහන් ආයතනයට නීත්‍යානුකූලභාවය අනිසි අයුරින් ලබාදීමට විරුද්ධව දීප ව්‍යාප්ත ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමට ඉහත කී මධ්‍යම කාරක සභාවේදී තීරණය විය.

මෙයට විශ්වාසී,

වෛද්‍ය චන්දික එපිටකඩුව,
ලේකම්.

වැඩිදුර විස්තර
වෛද්‍ය උපුල් ගුණසේකර - 0716841272
වෛද්‍ය සංකල්ප මාරසිංහ - 0714486770